**සී/සහිත ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පුද්ගලික) සමාගම - 2016**

---

සී/සහිත ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 2016 හා 2017 සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව සමාගමේ සභාපති වෙත 2018 නොවැම්බර් 13 දින නිකුත් කරන ලදී. 2016 විස්තරාත්මක වාර්තාව සමාගමේ සභාපති වෙත 2019 දෙසැම්බර් 18 දින නිකුත් කරන ලදී. සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව 2019 ජනවාරි 03 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරයි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **මතය ව්‍යාචනය සඳහා පදනම**

(අ) සමාගම විසින් ගැලපුම් සිදුකිරීමේදී නියමිත පරිදි ගිණුම්කරණ සටහන් තබා ගැනීමකින් තොරව, සෘජුවම ශේෂ පිරික්සුමට ගැලපුම් සිදු කර තිබුණි. තවදුරටත් සඳහන් කරන විට දේපල පිරියත හා උපකරණ, ක්ෂය සඳහා ප්‍රතිපාදන, ප්‍රදාන වත්කම් සඳහා වූ විලම්බිත ආදායම් සහ උපචිත වියදම් සඳහා ලෙජර ගිණුම් නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2016 ජනවාරි 01 දිනට සමාගමේ දේපල පිරියත හා උපකරණ වල සහ අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය පිළිවෙළින් රු.13,364,281ක් සහ රු.2,826,317 ක් විය. එසේ වුවද ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන සමාග විසින් පවත්වා නොගැනීම නිසා එම ශේෂයන්හි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.

(ඈ) සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව, මූල්‍ය ක්ෂය වෙන්කිරීම සිදුකළ යුත්තේ හීන වන ශේෂ ක්‍රමය වුවද, ක්ෂය ගණනය කිරීම සරල මාර්ග ක්‍රමය පදනම් කරගෙන සිදුකර තිබුණි.

(ඉ ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 63 ඡේදය අනුව හානිකරණ අලාභ හඳුනා ගත යුතුය. කෙසේ වෙතත් සමාගම විසින් දේපල පිරියත හා උපකරණ සඳහා හානිකරණ පරීක්ෂණයක් සිදු කර ඒ අනුව අවශ්‍ය ගිණුම්කරණ පිළියම් සිදු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 55 ඡේදයට පටහැනිව, පාරිතෝෂිත දීමනා සඳහා බැඳීම සමාගම විසින් ගණනය කර ඇත්තේ සම්පූර්ණ කළ සේවා වර්ෂ ගණන සඳහා සමාලෝචිත මූල්‍ය වර්ෂයේ අවසන් මස වැටුපෙන් මාස භාගයක වැටුප පදනම් කර ගෙනය.

(උ) මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරන, ගැලපීම් කරන ලද ගැලපුම් හතරක් වූ ලියා හරින ලද සහ නැවත ලියන ලද ශේෂයන්, ප්‍රදාන වත්කම් සඳහා විලම්බිත වගකීම, අස්පෘශ්‍ය වත්කම් සඳහා සමුච්චිත ක්ෂය, දේපල පිරියත සහ උපකරණ සඳහා සමුච්චිත ක්ෂය ඇතුළුව එකතුව රු. 19,406,114 ක් වූ මූලික වැරදි / පෙර වර්ෂ වල ගැලපුම් වල නිරවද්‍යතාව, ගැලපුම් කරන ලද ශේෂයන්, ගැලපීම් සඳහා හේතුන් සහ ගැලපුම් සඳහා අනුමැතිය යන තොරතුරු නොමැති වීම නිසා විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය.

(ඌ) කිසිදු අනුමැතියකින් තොරව, එකතුව රු.2,085,000 ක ගමන් වියදම් දීමනාවක් සහ එකතුව රු.347,500 ක වෛද්‍ය දීමනාවක් සමාගමේ සේවකයන් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවා ඇත.

(එ) ප්‍රදාන ලැබීම් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ලබාදී නොතිබුණි. එබැවින් ප්‍රදාන වත්කම් සඳහා වූ විලම්භිත වගකීමේ 2016 දෙසැම්බර් 31 ශේෂය වන රු. 8,304,581 සහ රු. 1,697,414 ක අගයක් ආදායම් ප්‍රකාශයට මාරු කිරීමේ පදනමෙහි නිරවද්‍යතාවය විගණනයේදී සත්‍යාපනය කරගැනීමට නොහැකි විය.

(ඒ) ගෙවීම් වවුචර සහ සැපයුම්කරුවන් ගේ ඉන්වොයිස් විගණනයට ඉදිරිපත් නොකළ නිසා සැපයුම්කරුවන්ට ගෙවන ලද රු. 396,534 ක ගෙවීම් වල නිරවද්‍යතාවය, විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඔ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනයෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල රු. 31,012,295 ක් විය. එසේ වුවද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම අගය රු. 30,078,398 ක් වූයෙන් ශේෂයන් අතර රු. 933,897 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) මුදල් පොත විගණනයට නොසැපයීම නිසා මූල්‍ය මුදල් ලැබීම් සහ ගෙවීම් සාරාංශය සහ ආරම්භක මුදල් ශේෂය පදනම්ව සමාලෝචිත වර්ෂයේ මුදල් ශේෂය විගණක විසින් ගණනය කරන ලදී. ඒ අනුව 2016 දෙසැම්බර් 31 වන දිනට ගණනය කරන ලද මුදල් ශේෂය රු.7,117,769 ක් විය. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 2,665,528 ක් වූයෙන් රු. 4,452,241 ක වෙනසක් නිරීක්ෂණය විය. තවදුරටත් මුදල් ශේෂයෙහි නිරවද්‍යතාවය සත්‍යාපනය කර ගැනීමට අදාළ බැංකු ශේෂයෙහි බැංකු ශේෂ තහවුරුව විගණනයට නොලැබුණි.

(ක) සයිබර් ආරක්ෂණ ව්‍යාපෘතියට අදාළව විදේශ ගමන් වියදම් රු. 7,816,060 ක් ආදායම් යටතේ සටහන් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස අදාළ ආදායම ඊට සමාන අගයකින් ඌන ගණනය වී තිබුණි.

(ග) මාසික සාරාංශ අනුව සමාගමේ සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් වියදම් රු. 23,933,916 ක් විය. එසේ වුවද, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය අනුව එය රු. 21,765,000 ක් වූයෙන් එම අගයන් දෙක අතර රු. 2,168,916 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය ව්‍යාවනය

------------------

මෙම වාර්තවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන, සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------------------

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මා දරන්නා වූ මතය:

- විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි වූ අතර මාගේ පරීක්ෂාවෙන් පෙනෙන පරිදි නිසි ගිණුම් වාර්තා සමාගම විසින් තබා නොමැත.

- සමාගම 2013 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ටාර් සමග ගොණුගත කර නොතිබීම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල බව මා දරන්නා වූ මතය වේ.